## 186 මගේ සිතට

මගේ සිතට සහනයක් පතා
සමිඳුගේ පාමුල වැඳ වැටිලා
යැඳුම් ගොඩක් යැද සිතුම් පැතුම් සැම
එතුමන් සුරතට බාර කළා

මව් පිය සෙනෙහස මට නොලැබේ
සොහොයුරු ප්‍රේමය ලැබ නොමැතේ
එහෙත් සමිඳේ ඔබගේ ප්‍රේමේ
කෙලෙසින් හො මට පෙන්වන්නේ

මිතුරු හමුව මට තහනම් වී
සමාජ ඇසුරට ඉඩ නොලැබී
සිටිනා විට මා තනිකඩ වී
ඔබ මට මිතුරකු ලෙස පෙනුණි

බෙදා හදා ගෙන සිතුම් පැතුම්
හා දුක සැප මගෙ පැන සමගින්
සිටියේ නැතැත් කිසි කෙනෙකු ළඟින්
සමිඳු වෙසෙයි නිති මා සමඟින්

ඔබ මට දිනෙක පියෙක් වූවා
තවත් දිනෙක මට මව වූවා
සොහොයුරු සොහොයුරියන් වූවා
සැම දා මට මිතුරෙක් වූවා